# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි තෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## අවස්ථා කළමනාකරණය – DIAD 31112

කාලය :- පැ 02 මි.10

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත ය.
❖ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

01) Women in Business (WIB) කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා කටයුතු කරන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානයකි. මෙම සංවිධානය මඟින් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා දේශීයව අරමුදල් රැස් කිරීමට අපේක්ෂා කර ඇත. මෙසේ අරමුදල් රැස් කිරීමට WIB ආයතනයට අනුබද්ධිතව Z Event International නමින් ආයතනයක් පිහිටුවා ඇත. අරමුදල් රැස් කිරීමේ ප්‍රථම පියවර වශයෙන් Chinese Food Festival යනුවෙන් උළෙලක් කොළඹ තුරඟ තරඟ පිටිය (Colombo Race Course) කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට ආයතනයේ කළමනාකාරිත්වය තීරණය කර ඇත. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන හෝටල් 25ක් පමණ සම්බන්ධ කර ගැනීමටත්, ඉහළ ප්‍රචාරණයක් ලබා දෙමින් 50,000ක් පමණ සහභාගී කර ගැනීමටත්, දින 03ක් පුරා උළෙල පැවැත්වීමටත්, සංවිධායක මණ්ඩලය තීරණය කර ඇත. උළෙලට අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීම සඳහා අනුග්‍රහකයන් වෙත ඉදිරිපත් කිරීමට සුදුසු වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කරන්න.

(ලකුණු 15)

02) රටක ආර්ථික සහ දේශපාලනික පරිසරයේ ස්ථාවරත්වය අවස්ථා කළමනාකරණ කර්මාන්තයේ ප්‍රගමනය සඳහා සෘජුවම බලපානු ලබන සාධකයකි. සමාජීය පරිසරය විශ්ලේෂණයෙන් මඟින් අවස්ථා කළමනාකරුවාට නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමටත්, තාක්ෂණික පරිසරය විශ්ලේෂණයෙන් අවස්ථාවට අමතර වටිනාකමක් එක් කර ගැනීමටත් අවකාශය සැලසේ. අවස්ථා පරිසරය විශ්ලේෂණය නොකිරීම අවස්ථා සැලසුම් අසාර්ථකවීමට බලපාන ප්‍රබල සාධකයකි. උදාහරණ සපයමින් අවස්ථා කළමනාකරණයේ දී පරිසර විශ්ලේෂණයේ ඇති වැදගත්කම පැහැදිළි කරන්න.

(ලකුණු 15)

03) ඔබ Xcel Events නම් අවස්ථා කළමනාකරණ ආයතනයේ අවස්ථා කළමනාකරුවකු ලෙස සේවය යෙදී සිටී. ඔබගේ කණ්ඩායමම සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විතය. 2023 මාර්තු මස පළමු සතිය තුළ දී ඔබ ඇතුළු කණ්ඩායමට පුද්ගලික අංශයේ බැංකුවක වාර්ෂික මහ සභා රැස්වීමක්, ප්‍රසිද්ධ නර්තන පාසලක නර්තන ප්‍රසංගයක්, රාජ්‍ය ආයතනයක් මඟින් ක්‍රියාත්මක කරන ව්‍යවසාය සංවර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශනයක් සහ ප්‍රසිද්ධ රංගන ශිල්පිනියකගේ විවාහ මංගල්‍යයක් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමේ අභියෝගය ආයතනයේ ඉහළ කළමනාකරණය විසින් පවරා ඇත. එහි දී යහපත් සේවක සහ පාරිභෝගික සම්බන්ධතා පවත්වා ගනිමින් ඔබගේ කටයුතු සැලසුම් කරන ආකාරය සම්බන්ධව ඉහළ කරළමනාකරණය දැනුවත් කිරීම සඳහා වාර්තාවක් පිළියෙල කරන්න.

(ලකුණු 15)

04) **"රාජ්‍ය අංශය මඟින් සැලසුම් කරන අවස්ථාවන්ට වඩා පුද්ගලික අංශය මඟින් සැලසුම් කරන අවස්ථාවන්ට ඉහළ ප්‍රේක්ෂක ආකර්ශණයක් හිමිවේ."** රාජ්‍ය සහ පුද්ගලික අංශයේ අවස්ථා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව ඔබගේ අවබෝධය උපයෝගී කරගනිමින් ඉහත ප්‍රකාශණය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 15)

05) අවස්ථා කළමනාකරණ කර්මාන්තය දේශීය සහ විදේශීය වශයෙන් පුළුල් කිරීමේ දී ඔබගේ අවධානය යොමු කළ හැකි නව ප්‍රවණතාවයන් 05ක ප්‍රායෝගික භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.
(ලකුණු 15)

06) නර්තන ප්‍රසංගයක් සඳහා යෝග්‍ය අළෙවිකරණ සැලැස්මක් පිළියෙල කිරීමේ දී ඔබ අනුගමනය කරන ක්‍රියාවලිය පැහැදිලි කරන්න.
(ලකුණු 15)

**…………………. 2023.01.28**